අල්ලාහ්ගේ දූතයාණෝ (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) වෙනත් දිනවල උනන්දුවෙන් කටයුතු නො කළ ආකාරයට අවසන් දින දහයේ උනන්දුවෙන් යුතුව කටයුතු කරන්නට වූහ

දේවත්වය විශ්වාස කළ මුඃමින්වරුන්ගේ මෑණිය වූ ආඉෂා (රළියල්ලාහු අන්හා) තුමිය
විසින් වාර්තා කරන ලදී: "අල්ලාහ්ගේ දූතයාණෝ (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) වෙනත් දිනවල උනන්දුවෙන් කටයුතු නො කළ ආකාරයට අවසන් දින දහයේ උනන්දුවෙන් යුතුව කටයුතු කරන්නට වූහ."
[صحيح] [رواه مسلم]

රමළාන් මාසයේ අවසන් දින දහය උදා වූ විටෙක නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණෝ නැමදුම්වල හා අවනතභාවයේ කටයුතුවල කැපවීමෙන් යුතුව නිරත වූහ. විවිධ යහපත් ක්රියාවන්හි හා දැහැමි කටයුතුවල දී අතිශයෝක්තියෙන් කටයුතු කළහ. වෙනත් දිනවලට වඩා අධික ලෙස නැමදුම්වල නිරත වූහ. එය එම රාත්රියන්හි මහිමය අති උතුම් බැවින් හා ලෙයිලතුල් කද්ර් රාත්රිය සොයමිනි.

https://www.sunnah.global/hadeeth/si/show/3755